සමාජ සුබ සාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය,

සබරගමුව පළාත් සභාව.

**සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයෙහි පරිවාස, ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන සේවා ගණයට (PL 1 -2016) අයත් ළමා සංවර්ධන සහකාර තනතුර සඳහා විවෘත බඳවාගැනීම.**

2019.12.30 දින සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටියට අනුව සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයෙහි පරිවාස, ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන සේවා ගණයට (PL 1 -2016) අයත් ළමා සංවර්ධන සහකාර විවෘත බඳවාගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. සබරගමුව පළාත් සමාජ සුබ සාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු වල ප්‍රමුඛතාවය මත ඉහළම කුසලතාවය දක්වන අයදුම්කරුවන් කුසලතා අනුපිළිවෙලට පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන ප්‍රමාණයක් රා.පරි.චක්‍රලේඛ 15/90 විධි විධාන පරිදි දිස්ත්‍රික් ජන අනුපාතය අනුපාතය අනුව බඳවා ගනු ලැබේ.
2. 2016.02.25 දිනැති හා 03/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි උපලේඛන 1 අනුව PL 1 -2016 වැටුප් බණ්ඩය මෙම තනතුරට හිමිවන අතර එයට අදාල, මාසික වැටුප් පරිමාණය රු. 24,250 -10 x 250 - 10 x 270 - 10 x 300 – 12 x 330 - 36,410/- වේ. එම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට වැටුප් ගෙවනු ලැබේ.

3. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.
4. සපුරාලිය යුතු සුදුසුකම්

(අ) අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් ( 02 ) සහිතව විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

(ආ) පළපුරුද්ද :

රජයේ හෝ අර්ධ රාජ්‍ය, විශේෂ අවශ්‍යතා සහිත දරුවන් රැකබලා ගැනීම, ඔවුන්ගේ සංවර්ධනය උදෙසා වැඩසටහන් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම සම්බන්ධ අවම වශයෙන් වසරකට නොඅඩු පළපුරුද්ද.

(ඉ) කායික සුදුසුකම් :

සබරගමුව පළාතේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට යෝග්‍ය වන යහපත් මානසික හා මනා ශාරීරික සෞඛ්‍ය තත්වයකින් යුක්ත වීම.

(ඊ) වෙනත් :

I. අයදුම්පත් කැඳවනු ලබන දිනට අයදුම්කරු සබරගමුව පළාත තුල ස්ථිර පදිංචි අයෙකු විය යුතු අතර, අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03 ක් තුල අයදුම්කරුට සබරගමුව පළාතේ වසර 03 ක ස්ථිර පදිංචිය නොමැත්තේ නම් අයදුම්කරුගේ කලත්‍රයා අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03 ක කාලය තුල සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් , එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

IV. අයදුම්පත් බාරගන්නා අවසන් දිනට වයස අවු.18 ට නොඅඩු විය යුතු අතර වයස අවු.45 ට නොවැඩි විය යුතුය.

06. අයදුම්කිරීමේ ක්‍රමය

I. අයදුම්පත්‍රය මෙම නිවේදනයේ අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එය කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර තම අත් අකුරින්ම පිරවිය යුතුය. සම්පූර්ණ කරනු ලබන විභාග අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සටහන් කර ඇති අයදුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

II. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙලවරේ **පරිවාස, ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ළමා සංවර්ධන සහකාර තනතුර සඳහා විවෘත බඳවාගැනීම** යන්න සඳහන් කරන්න.

III. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කල තනතුරක් දරන නිලධාරියකු, වාර්ෂික වැටුප රු.240,360.00 ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරණ නිලධාරියකු විසින් හෝ සහතික කරනු ලැබ සිටිය යුතුය.

IV. අපේක්ෂකයන් විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **ලේකම්, සමාජ සුබ සාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව,** නව නගරය, **රත්නපුර** යන ලිපිනයට **2020 මාර්තු 20** දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත දිනට පසුව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම්

අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු පසු කලකදී වැරදි බව පෙනී ගියහොත් හෝ ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඇය තවදුරටත් පත්වීමක් ලබාදීම සම්බන්ධයෙන් සළකා බලනු නොලබන අතර මෙය හේතු කොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහකිරීමට වුවද යටත් වේ.

08. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමටද, මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව තීරණ ගැනීමට ද සමාජ සුබසාධන,පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ට බලය ඇත.

එච්.ඩී.සිසිර,
ලේකම් (වැ.බ.),
සමාජ සුබසාධන,පරිවාස හා ළමාරක්ෂක,
ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව.

2020.02.26 දින දීය.

එච්.ඩී. සිසිර
ලේකම් (වැ.බ.)
සමාජ සුබසාධන පරිවාස හා ළමාරක්ෂක
ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව,
නව නගරය-රත්නපුර

ආදර්ශ අයදුම්පත්‍රය

<u>සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයෙහි පරිවාස, ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන සේවා ගණයට **(PL 1 -2016)** අයත් ළමා සංවර්ධන සහකාර තනතුර සඳහා විවෘත බඳවාගැනීම.- 2020</u>

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

---

1.0

i. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම : ............................................................................................................

.................................................................................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ : PERERA, A.B.C.

ii. මුලකුරු සමඟ නම : .......................................................................................................................

(සිංහලෙන්/දෙමළෙන්)

iii. මුලකුරු වලින් හැඳින්වෙන නම : ....................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

iv. මුලකුරු වලින් හැඳින්වෙන නම : ....................................................................................................

(සිංහලෙන්/දෙමළෙන්)

2.0

I. ස්ථිර පදිංචි ලිපිනය : ...........................................................................................................................

.................................................................................................................................................................

II. විභාග ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය : ........................................................................................

.................................................................................................................................................................

3.0 ස්ත්‍රී / පුරුෂ භාවය : ස්ත්‍රී - 1 පුරුෂ - 2 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

4.0 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

5.0 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

6.0 දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

7.0 අධ්‍යාපන සුදුසුකම් :

7.1 අ.පො.ස.(සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර

I.විභාගයේ වර්ෂය හා මාසය : ......................................
II.විභාග අංකය : ..........................................................
III.ප්‍රතිඵල : ..................................................................

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

I.විභාගයේ වර්ෂය හා මාසය : ......................................
II.විභාග අංකය : ..........................................................
III.ප්‍රතිඵල : ..................................................................

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

**සැ.යු. :- විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද අ.පො.ස.(සා/පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනය සත්‍ය බවට සහතික කළ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.විභාගය සමත්ව ඇත්තේ දෙවරක දී නම් වාර දෙකෙහි විස්තර හා ප්‍රතිඵල වෙන වෙනම දැක්විය යුතුය.**

9.0 ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

(අදාල කොටුවේ √ ලකුණ යොදන්න.) ඔව්, නම් විස්තර සඳහන් කරන්න.

.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

10.0 පළපුරුද්ද (පළපුරුද්ද සනාථ කිරීම සඳහා සේවා සහතිකයේ සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කල යුතුය.)

ගැසට් පත්‍රයේ 04.(ආ) අනුව සේවය කර ඇති ආයතනය හා කාලය - ..............................................................
.......................................................................................................................................
.......................................................................................................................................

11.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරාගැනීමට එකඟ වෙමි.තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරනු ලබන මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව ද ප්‍රකාශ කරමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

.................................................... ....................................................................

දිනය අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන

සටහන - අත්සන සහතික කිරීමට බලයලත් නිලධාරියා ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

**අත්සන සහතික කිරීම.**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..............................................................................මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත් ඔහු/ඇය මා ඉදිරිපිට දී........................ වැනි දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව සහතික කරමි.

..................................................................

සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව

දිනය : ....................................................

නම : ....................................................

පදවි නාමය : ....................................................

ලිපිනය : ....................................................